# දිනෙන් දින තර්ජනයට ලක්වන සියොතුන් රැක ගනිමු

ස්වභාව ධර්මයේ අපූරු නිර්මාණ අතර අගනා සම්පතකි විහග සම්පත. ලොව පුරා ජෛව විවිධත්වයෙන් යුතු රටවල් අතර ශ්‍රී ලංකාවට සුවිශේෂී ස්ථානයක් ලැබෙන අතර එය වඩ වඩාත් ඔපවත් වීමට, වර්ණවත් වීමට, ගීතවත් වීමට විහගුන් ලබා දෙන්නේ මහත් රුකුලකි. නමුත් කෙමෙන් කෙමෙන් වැනසී යන ස්වභාවධර්මයේ සමතුලිතතාවය සමග මෙම අපූරු විහගුන්ටද උදාවී ඇත්තේ නපුරු කලදසාවකි.

ශ්‍රී ලංකාවට පමණක් විශේෂිත වූ පක්ෂීන් ගණන විසිහයකි. මෙම පක්ෂි විශේෂ ශ්‍රී ලංකාව පුරා ඇති බිම් තීරු තුළ වනපියස් මත, නිල් අහස පුරා විසිරී පැතිරී තම චර්යා රටාවන් පවත්වා ගනිමින් ජීවත් වෙයි. කලාප වශයෙන් ගත්විට මින් වර්ග නවයක් පහත රට තෙත් කලාපයේ හා කඳුකර කලාපයේ පමණක් දක්නට ලැබෙන අතර තවත් වර්ග හයක් කඳුකර කලාපයේ පමණක් දක්නට ලැබේ. ඉතුරු වර්ගයේ පක්ෂීන් සියලුම භූගෝල කලාපයන්ගේම වාර්තාවේ. එමෙන්ම පක්ෂි ලෝකයේ නවතම සාමාජිකයා බස්සන් වර්ගයකට අයත් වන "පඬුවන් බස්සා" යි. එහි සාඩම්බර හිමිකාරයා වන්නේ අපේ මව්බිම වීම තවත් සුවිශේෂී කාරණයකි. විසිහයක් වූ ශ්‍රී ලංකාවට විශේෂිත වූ පක්ෂීන් ගණන එවිට විසි හතක් දක්වා වර්ධනය වනු ඇත.

## මෙරටට පමණක් විශේෂිත පක්ෂීන්

| | |
|---|---|
| 1. වලි කුකුළා | 2. හබන් කුකුළා |
| 3. කඳුකර මයිල ගොයා | 4. අලු ගිරවා |
| 5. ගිරා මලිච්චා | 6.රතුමුහුණැති මල්කොහා |
| 7. බට ඇටි කුකුළා | 8. කඳුකර කොට්ටෝරුවා |
| 9. රතු දෙමලිච්චා | 10. ගුරු කොණ්ඩයා |
| 11. පුල්ලි වල් අච්චිච්චියා | 12. අරංගයා |
| 13. හිස දුඹුරු දෙමලිච්චා | 14. හිස අළු දෙමලිච්චා |
| 15. ලංකා හම්බු කුරුල්ලා | 16. අඳුරු නිල් මාරාවා |
| 17. ලංකා පිළලිච්චා | 18. ලංකා මල් කුරුල්ලා |
| 19. හිස සුදු මයිනා | 20. ලංකා සැළලිහිණියා |
| 21. කැහිබෙල්ලා | 22. අළු කෑදැත්තා |
| 23. දුඹුරු කැලෑ බස්සා | 24. හීන් කොට්ටෝරුවා |
| 25. හිස කළු කහ කොණ්ඩයා | 26. කඳුකර වී කුරුල්ලා |

මෙම පක්ෂින් අතිරින් විශාලම පක්ෂියා වලිකුකුළා වේ. එටමන්ම වලි කුකුළා ජාතික පක්ෂියා ලෙසද අභිෂේක ලැබ සිටී.

## ශ්‍රී ලංකාවේ වඳවීමේ තර්ජනයට දැඩිව මුහුණු පා ඇති විහගුන්.

පොදුවේ ගත්කළ ස්වභාව ධර්මයේ සියලුම පද්ධතින් මිනිසාගේ පරිසර විරෝධී ක්‍රියාකාරකම් තුලින් තර්ජනයට ලක්වෙමින් පවතින අතර එයින් මිදීමට විහගුන්ටද කිසිසේත්ම හැකියාවක් ලැබී නැත.

මෙසේ පොදු තර්ජනයන්ට ලක්ව ඇති පක්ෂීන් අතර සුවිශේෂී පක්ෂීන් ගණනාවක් දැඩි තර්ජනයන්ට ලක්වී ඇති අයුරු හඳුනාගත හැක. මහකොණ්ඩ රාජාලියා, කණනිල් මල් පිලිහුඩුවා, කබලැතියා, හොට පළල් දුම්බොන්නා, මල් උස්ස වටුවා, කබල දෑ තුඩුවා, අලි කොකා, රතු මුහුණැති මල් කොහා, යන පක්ෂීන් මෙසේ දැඩි තර්ජනයට මුහුණපා ඇති බව පෙනේ. මෙම පක්ෂීන්ට අමතරව දිනෙන් දින බොහෝ විශේෂයන් මෙම ලැයිස්තුවට ඇතුලත් වන බව නොරහසකි.

## ශ්‍රී ලංකාවේ පක්ෂි අභයභූමි හා පක්ෂීන් නිරීක්ෂණය කළහැකි ස්ථාන.

පක්ෂි ලෝලීන් හට දෙස් විදෙස් පක්ෂීන් නැරඹිය හැකි බොහෝ ස්ථාන ස්වභාව ධර්මයා විසින්ම ශ්‍රී ලංකාව තුළ නිර්මාණය කොට ඇත. එයින් කුරුලු අභයභූමි ලෙස වෙන් කෙරුණු බිම් කොටස් මෙන්ම පක්ෂින් විශාල වශයෙන් ගැවසෙන ස්ථාන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම අපි අනිවාර්යයෙන්ම කළයුතු කටයුත්තකින් එකකි. ශ්‍රී ලංකාවේ විහගුන් සඳහා වෙන්වුණ සුවිශේෂීතම අභය භූමිය කුමනයි. මෙහි අක්කර පන්සියයක් පුරා විහිදුණ කුමන විල්ලුව පක්ෂීන්ගේ පාරාදීසයකි. නැගෙනහිරින් මුහුදත් දකුණු පසින් කුඹුකන් ඔයත් මායිම වුන කුමන විල්ලුව පන් පදුරු, කැරම් පදුරු, කිරල ගස් හා හම්බු පදුරු වලින් විහගුන් අමානන්දයට පත්කරයි. අවුරුද්ද පුරාවට මෙය විහගුන්ගේ රජදහනක් වුවද කුමනට වසන්තය උදා වෙන්නේ ඊසාන දිග මෝසම් සුළඟ ඇරඹීමත් සමගයි. අගෝස්තු, සැප්තැම්බර් මාස වලදී දැකුම්කලු සංක්‍රමණික පක්ෂීන් කුමනට සංක්‍රමණය වේ.

### කෝකිලායි කලපුව :-

මෙය උතුරු මුහුදු තීරයේ නැගෙනහිර ප්‍රදේශයේ පිහිටි තවත් අභය භූමියකි. ඊසාන දිග මෝසම් වැසි වලින් මෙම කලපුව පිරියයි. මෙය නොයෙක් වර්ගයේ කොකුන්ට පාරාදීසයකි. සියක්කාරයා මෙයින් ප්‍රධාන පක්ෂියෙකි. මෙය මුලතිවු නගරයට ආසන්නයේ පිහිටා ඇත.

### යෝධ වැව (මන්නාරම):-

යෝධ වැවේ දුපතක පිහිටි මෙම අභය භූමිය මන්නාරමේ සිට සැතපුම් දොළහක පමණ දුරකින් පිහිටයි. සංක්‍රමණික පක්ෂීන්ගේ සංක්‍රමණික මාර්ගයක් ආසන්නයේ පිහිටීම හේතුකොට ගෙන එම පක්ෂීන් නිරීන්ෂණයට මෙය පක්ෂි ලෝලීන්ට තෝතැන්නකි. කෝකිලායි වලදී මෙන්ම ඔබට මෙහිදීත් සියක්කාරයා නෙත්පුරා දැක ගැනීමට වාසනාව ලැබේ. පුත්තලම, යාපනය ආදියේ පමණක් දක්නට ඇති උසවටුවන්, කළු කවුඩන්, කොබෙයියන්, වැලි කිරලුන්ද යෝධවැව අභය භූමියේදී ඔබට නිරීක්ෂණය කළහැක.

**මලල්ල කලපුව (හම්බන්තොට):-**
ලංකාව පුරා පවතින ලේවායන්ද පක්ෂීන්ගේ හොඳ නවාතැන් බවට පත්වී ඇති අයුරුද දැකගත හැක. එයින් හම්බන්තොට ප්‍රදේශයේ කලපු සුවිශේෂී වේ. මෙරට මෙන්ම එතෙර බොහෝ පක්ෂීන්ද අවුරුද්ද පුරාවටම මෙම කලපු පුරා සැරිසරයි. සියක්කාරයන් දහස් ගණන් නෙත්පුරා දැක ගැනීමට ඔබ මෙහි යායුත්තේ පෙබරවාරි සිට සැප්තැම්බර් මුල දක්වා කාලය තුලයි.

**වීරවිල හා තිස්ස වැව :-**
ලංකාවේ විශාලතම ජලාශ්‍රිත පක්ෂීන් දැක ගැනීමට ඔබ යායුත්තේ වීරවිල වැවටයි. කොළඹ සිට සැතපුම් 162ක් පමණ ඈතින් වීරවිල වැව පිහිටා ඇත.

**තිස්ස:-**
වීරවිලට ආසන්නයේම පිහිටි තවත් වැවකි තිස්ස වැව. තිස්ස වැව මැද පිහිටි දූපත පක්ෂීන්ගේ අභය භූමියකි. අවුරුද්ද මුළුල්ලේම මෙහි ජලාශ්‍රිත සියොතුන් දක්නට ලැබේ.

**බුන්දල :-**
හම්බන්තොට දිස්ත්‍රික්කයේ තවත් එක් ලේවායකි. මෙම ලේවායද පක්ෂි අභයභූමියකි. සියක්කාරයින්, දෑතුඩුවන්, පැස්බරුන්, වල්තාරාවුන්, හැඩි ආලාවුන්, ඔටු මානාවුන්, පැසිකුඩුවන් මෙහි අවුරුද්දපුරා දැකිය හැක.

**කලමැටිය:-**
තංගල්ල දිස්ත්‍රික්කයට මෙය අයත්වේ. නොවැම්බර් සිට අප්‍රේල් දක්වා ජලාශ්‍රිත පක්ෂීන් ගණනාවක් මෙහි දැකිය හැක. මෙහි මඩගොහොරු වල ජීවී විශේෂත් කලපුවේ මසුනුත් පක්ෂීන්ගේ රසවත් ආහාර වනවාට සැකයක් නැත. මෙහි සියකිකාරයින්, වල් තාරාවුන්, පැසිතුඩුවන්, ලිහිණින්, කිතලුන් මෙන්ම සේරුන්ද බොහෝවෙයි.

**ශ්‍රීපාද වනාන්තරය :-**
උස් කඳුකරයේ විශේෂිත වූ පක්ෂීන් ගණනාවක්ම මෙම වනාන්තරයේ දක්නට ලැබේ. සැළලිහිණියා, දුර්ලභ කලු කුරුල්ලා, වතරතු මල්කොහා, ලිරා මලිච්චි, කඳුකර කොට්ටෝරුවා, වලිකුකුලා ආදී පක්ෂීන්ගෙන් මෙම වනය අලංකාර වේ. සිවුරු හොරා, සුදුරෙදි හොරා, කහකුරුල්ලා ආදී විචිත්‍ර පක්ෂීන් මෙම වනයේ සමහර මායිම් වලදී මා දැක ඇත. කන්කලු පක්ෂි නාදයන්ට නම් මෙම වනයේදී ඔබට නිසැකව සවන්දිය හැක.

**හෝර්ටන් තැන්න:-**
අප කවුරුත් දන්නා ලෝකාන්තය ආශ්‍රය කොට ගෙන විහිදෙන මෙම වනගත සානුව පුරා කඳුකර පක්ෂීන් බොහෝමයක් පැතිරී විසිරී සිටී. අරංගයා, කලු කුරුල්ලා, මල් කුරුල්ලා, කහ කොණ්ඩයා, ගොමරිත්තා ආදී සුවිශේෂී කුරුල්ලන් බොහෝමයක් මෙහි වෙසෙති. හපුතලේ ඔහිය මාර්ගයේත් කළුපහන උඩවේරිය මාර්ගයේත් තලවාකැලෙනුත් නුවරඑළිය රේන්දපොල හරහාත් වැලිමඩ ඔහොයිය මාර්ගයේත් මෙම ස්ථානයට ඔබට පැමිණිය හැක.

**නුවර එළිය (හග්ගල):-**
සුවිශේෂී පරිසර පද්ධතියකින් හෙබි හග්ගල අභය භූමියද කුරුල්ලන්ගෙන් පිරි රජදහනකි. ගුරු කොණ්ඩයා, අච්චිච්චියා, මල් කුරුල්ලා, කැහිබෙල්ලා මෙන්ම නොයෙක් උකුසු විශේෂ හා කුරුළු ගොයින් විශේෂ මා නිරීක්ෂණය කර ඇත.

**තංගමලේ (හපුතලේ) :-**
ඉදල්ගස්හින්න සිට හපුතලේ දක්වා වූ බිම්තීරයේ විහිදෙන්නා වූ එ අපූරු වන භූමිය තංගමලේ අභයභූමියයි. එයත් විහග රජදහනක් බව දන්නේ ස්වල්ප දෙනෙකි. කඳුකර පක්ෂීන් විශාල ප්‍රමාණයක් මෙහි වාසය කරන බව වාර්තාවේ. ගිරා මලිච්චා, කඳුකර වී කුරුල්ලා, කහ කොණ්ඩයා, නිල් පණු කුරුල්ලා, වළිකුකුළා, හිස දුඹුරු දෙමලිච්චා, රතු කෑරලා, කඳුකර මයිලගොයා, සුදුරෙදි හොරා, කහකුරුල්ලා ආදී පක්ෂීන් මෙන්ම මෑතකදී මා විසින් හපුතලේ ප්‍රදේශයට ආගන්තුක අළු කෑදැත්තන් ජෝඩුවක්ද නිරීක්ෂණය කළෙමි. මෙම තංගමලේ වන පියස පරිසර ලෝලීන්ගේ මෙන්ම පක්ෂි ලෝලීන්ගේද අවධානයට යොමුවිය යුතු වන පියසකි.

මෙසේ වන පක්ෂී බිම් අතර කෝට්ටේ පාර්ලිමේන්තුවඅවට බිම් පෙදෙස හා දියවන්නාව ආශ්‍රිත වගුරුබිම් කඩත්, යාපනයේ සරාසෙලෙයි හා පුන්නලායි යන ප්‍රදේශත් යාපනය අවට ඇති දූපතුත් බෙල්ලන්විල, අත්තිඩිය ආදී වගුරුබිම් ප්‍රදේශත් බහුල වශයෙන් පක්ෂීන් නිරීක්ෂණය කළ හැකි ප්‍රදේශයන්ය.ඉතින් දිනෙන් දින මේ අහිංසක පක්ෂීන්ගේ ලෝකය අප විනාශ කරමින් සිටින්නෙමු. හෙට දිනයටත් මේ විහග සම්පත රැකගැනීමට නම් මා ඔබෙන් එක ඉල්ලීමක් ඉල්ලමි. සොබාදම් දිනිතියට අපි අවබෝධයෙන් ලංවෙමු. අවබෝධයෙන් පරිහරණය කරමු. එවිට සොබාදම් දිනිතිය විහග සම්පත රැකගැනීමට තවදුරටත් අප වෙනුවෙන් කැපවනවා ඇත.

*කේ.ඒ.ඩබ්ලිව් සේනාධීර බණ්ඩාර,*
*සංගීත උපදේශක,*
*ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය,*
*පැලවත්ත,*
*බත්තරමුල්ල.*

*ග්‍රාමීය හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය.*